**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 01 - 2021**

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ -01 කොටසේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02 හි II ආ.3 වගන්තියේ සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

මූල්‍ය ගිවිසුමට අනුව, එවකට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වර්තමානයේ උක්, බඩඉරිගු,කජු,ගම්මිරිස්,කුරුඳු,කරාබුනැටි,බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත සහ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයෝජනයන් සැලසුම් සකස් කිරීමේ සඳහා සහය වීම, ගොවි නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රදානය, කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යනාදී සංරචක 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,612.28කට සමාන එ.ජ.ඩො මිලියන 106.97ක් වන අතර ඉන් රු.මිලියන 9,175.88කට සමාන එ.ජ.ඩො මිලියන 62.87ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,436.40කට සමාන එ.ජ.ඩො මිලියන 44.10ක් ප්‍රතිලාභීන් විසින් සැපයීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු පසු මූල්‍යනය යටතේ 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කරන ලද අතර 2021 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගනය කළ මතය

මාගේ වාර්තාවේ 1.2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල<br>රු.මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභීන් විසින් කරන ලද දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ දැක්වීමකින් තොරව ජංගම වගකීම් යටතේ සාවද්‍ය ලෙස දක්වා තිබුණි. | 10.2 | සටහන් කර ගන්නා ලද අතර ඉදිරි ගිණුම් වර්ෂයේදී (2022) නිවැරදි කරනු ලැබේ. | නිසි ඉදිරිපත් කිරීමක් සිදුකිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ගැලපුම් ප්‍රදාන පාලන ගිණුමේ සහ ගැලපුම් ප්‍රදාන ණයහිමි ගිණුමේ ශේෂය සමාන වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, මූල්‍ය ප්‍රකාශනවල එම ගිණුම්වල වෙනසක් නිරීක්ෂණය විය. | 3.96 | පසුගිය වර්ෂයේදී සැසඳීමක් සිදුකර තිබුණද වෙනසක් හඳුනා ගැනීමට නොහැකි විය. අතින් කරන ක්‍රමයේ සිට සැග් ඇක්පැක්වලට (Sage Accpacc) මාරු කිරීමේදී දත්ත ඇතුළත් කිරීමේ දෝෂයක් වේ. | වෙනස හඳුනා ගැනීමට සහ දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

-------------------------

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික මූල්‍ය ප්‍රගතිය**

-----------------------------------------------------

ඉහළ වටිනාකමක් සහිත කෘෂි නිෂ්පාදන සහ අගය අගය එකතු කිරීම සඳහා කුඩාපරිමාණ නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යවසායකයන්ගෙන් ආකර්ෂනීය සහ සහය ආයෝජන මඟින් වාණිජ සහ අපනයන නැඹුරු නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වුවද, ව්‍යාපෘතියේ මැදිහත්වීමෙන් උත්පාදනය කළ අමතර අපනයන ඉපයීම් සහ උත්පාදනය කළ අමතර රැකියා යනාදී පිළිබඳ තොරතුරු පවත්වාගෙන නොතිබුණි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා රජය ණය නියෝජිතායතනය වෙත පොළී ගාස්තු ලෙස එකතුව රු.මිලියන 302.9ක් ගෙවා තිබුණි. ව්‍යාපෘතියේ ආරම්භක අරමුණු පසුව වෙනස්වී තිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ කටයුතු සංරචක 3ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. එනම්

(අ) ආයෝජන සැලසුම් සකස් කිරීම සඳහා සහය ලබාදීම

(ආ) ගොවි නිෂ්පාදකයින්ගේ සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබාදීම

(ඇ) ණය සඳහා කොටසකට ඇපවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| සංරචකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබාදීම | (i) ප්‍රාග්ධන ගැලපුම් දීමනාව වැඩසටහන ඉහළ දරිද්‍රතාවයකින් පෙළෙන්න සිටින යාපනය, මුලතිවු, අනුරාධපුර,මඩකළපුව, මොනරාගල, මාතලේ සහ පොළොන්නරුව යන ප්‍රමුඛ දිස්ත්‍රික්ක හතක ආසන්න වශයෙන් ගොවි නිෂ්පාදන සංවිධාන 350 වෙත සහය ලබාදීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබාදීම කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල ඇතුළුව වෙනත් දිස්ත්‍රික්ක 15ක් තෝරාගෙන තිබුණු අතර මුළු ප්‍රතිපාදනයෙන් ඉහත සඳහන් වෙනත් දිස්ත්‍රික්ක 15 වෙත සියයට 95.21ක් වෙන් කර තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ඉහළ ආයෝජනයන් සහිත වඩාත් ශක්‍යතාවයක් ඇති ව්‍යාපෘති පිළිබඳව අනෙකුත් දිස්ත්‍රික්කවල ව්‍යාපෘති සහ ආයෝජන පිළිබඳව සැලකීමට සිදුවිය. | ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට ව්‍යාපෘති ඇගයීම් ලේඛණවල සඳහන් අරමුණු සමඟ අනුගත වීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii) ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දක්වා යෝජිත සමාගම් 234ක් වෙත ලබාදීමට එකතුව රු. මිලියන 5,162.9ක ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලෙස අනුමත කර තිබුණද, අනුමත කරන ලද දින සිට මාස 06 සිට මාස 48ක කාලයක් ගත වී ඇතත් ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබාදී නොතිබුණි. | පහත සඳහන් හේතු නිසා ප්‍රධාන වශයෙන් ප්‍රමාද වී ඇත.<br>1. යෝජිත සමාගමේ මූල්‍යානය ප්‍රමාදවීම සහ ව්‍යාපෘති ආරම්භ කිරීමට සූදානමක් නොමැතිවීම.<br>2. නියමිත වේලාවට නීති ලියවිලි ඉදිරිපත් කර නොතිබීම<br>3. කොවිඩ් 19 නිසා රට වැසීම හේතුවෙන් අමතර ප්‍රමාදයක් සිදුවිය. | -එම- |
| | (iii) 2018,2019 සහ 2020 වර්ෂවලදී යෝජිත සමාගම් 544ක් සඳහා අනුමත ප්‍රාග්ධන ගැලපුම් දීමනා රු.මිලියන 9,802කින් සමාගම් 128ක් වෙත පළමු වාරිකය ලෙස රු.මිලියන 2,345ක් පමණක් ලබාදී තිබුණි. එකඟවූ කටයුතු වලට අසම්පූර්ණතාව හේතුවෙන් ඉහත සමාගම් සඳහා පළමු වාරිකයේ දින සිට මාස 5සිට 15ක කාලයක් ගතවීමෙන් පසුවද අදාල යෝජිත සමාගම් 400 වෙත රු.මිලියන 6,476.8ක් වටිනා දෙවැනි වාරිකය ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතියේ සංවේදී ස්වභාවය යෝජිත සමාගම්වලට කටයුතු කඩිනම් කිරීමට නොහැකිවීම ප්‍රමාදයට ප්‍රධාන හේතුව වේ. ශ්‍රී ලංකා රජය පනවන ලද ප්‍රධාන ආනයන සීමා සහ ගෝලීය වශයෙන් පනවන ලද ගමන් සීමා හේතුවෙන් ආයෝජකයින් මුහුණ දෙන ලද කරුණු හේතුවෙන් නොවැලැක්විය හැකි ප්‍රමාදයන් සිදුවිය. | -එම- |
| | (iv) ව්‍යාපෘති ඇගයුම් ලේඛණයේ ඇමුණුම 2හි 8(ආ) vi වගන්තියට අනුව ආයෝජන යෝජනාව සහ ප්‍රාග්ධන ගැලපුම් දීමනාව අවුරුදු 2ක් 3ක් නොඉක්මවන කාලයක් පුරා ක්‍රියාත්මක කළ යුතුය. කෙසේවෙතත්, 2017,2018 සහ 2020 වර්ෂවලදී යෝජිත සමාගම් 544ක් සඳහා අනුමත ප්‍රාග්ධන ගැලපුම් දීමනා රු.මිලියන 9,802කින් 2021 වර්ෂය අවසානය වන විටදී රු. මිලියන 422ක් වටිනා යෝජනා 38ක් පමණක් ආයෝජන කටයුතු නිමකර තිබුණි. | අනවශ්‍ය ප්‍රමාදයන් ඉවත් කරමින් දෙපාර්ශවයම එකට වැඩ කටයුතු සිදුකරන අතර සඳහන් කාලය තුළ අදියරයන් කඩිනම් කරමින් සිටී. | -එම- |

| | | | |
|---|---|---|---|
| | (v) විගණනයේදී සිදුකරන ලද අහඹු පරීක්ෂාවකට අනුව 2017, 2018 සහ 2019 වර්ෂවලදී රු.මිලියන 98.10ක ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබා දී තිබුණු සමාගම් 17ක් සිය ව්‍යාපෘති කටයුතු නතර කර තිබුණු අතර සමාලෝචිත වර්ෂ අවසානය වන විට ඉන් රු.මිලියන 1.35ක් පමණක් ආපසු ගෙවා තිබුණු බව අනාවරණය විය. පෙර වර්ෂයේ මාගේ වාර්තාවේ සඳහන් පරිදි සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතිය විසින් ඉතිරි මුදල වූ රු.මිලියන 96.75 අයකර ගැනීමට සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කරන ලද අධීක්ෂණ කටයුතුවලදී අධීක්ෂණ සහ ඇගයීම් විශේෂඥවරු ලේඛණයක් නඩත්තු කර තිබුණි. එය පදනම්කර ගනිමින් ව්‍යාපෘති දෙකක් පමණක් නතර කර ඇති බව දැන ගන්නා ලද අතර මේවන විටත් ගෙවන ලද ප්‍රදාන අයකර ගැනීමට පියවර ගෙන ඇත. | -එම- |
| | (vi) 2019 පෙබරවාරි කරන ලද හත්වෙනි ක්‍රියාත්මක කිරීමේ සහය දූතමණ්ඩලයට තීරණය අනුව, 2022 මාර්තු 03 විගණිත දින වන විටත් ප්‍රදාන ආයෝජනවල ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳ සුදුසු දත්ත එකතු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වුවද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අධීක්ෂණ සහ ඇගයීම් විශේෂඥවරු 2019දී සේවයේ යොදවන ලද අතර ප්‍රතිඵල පිළිබඳව නිසි දත්ත එකතු කිරීම මඟින් නිසි අධීක්ෂණයක් සිදු කරනු ලැබේ. ප්‍රදානවල බලපෑම ව්‍යාපෘති අනුව වෙනම විශ්ලේෂණය කර ඇති අතර කාර්තුමය වාර්තා ලබාගනී. | මෙ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කර කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) ණය සඳහා කොටසකට ඇප වීම | ව්‍යාපෘතියේ ණය සඳහා කොටසකට ඇප වීම සංරචකය යටතේ කටයුතු සිදු කිරීමට එ.ජ.ඩො මිලියන 7.12ක ප්‍රතිපාදන මුදල 2021 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | ණය සඳහා කොටසකට ඇප වීම පිළිබඳ විගණකගේ මතය නිවැරදි අතර පිළිගනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තු අංශය මඟින් ණය සඳහා කොටසකට ඇප වීම යටතේ අරමුදල් සම්පූර්ණයෙන්ම පාලනය සහ අධීක්ෂණය කරනු ලැබේ. | මෙම ණය යෝජනා ක්‍රමය පෞද්ගලික බැංකු මගින් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| **විගණන ගැටලුව** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| සුළු හා කුඩා ව්‍යාපෘති සඳහා ව්‍යාපාර යෝජනා සකස් කිරීමට සහාය ලබා ගැනීමට ව්‍යාපෘතිය උපදේශන සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර නොගැනීම හේතුවෙන් රු.මිලියන 8.85ක් ගෙවීමෙන් පසු කොන්ත්‍රාත් කටයුතු | තෘප්තිමත් කාර්යසාධනය සහ සපයන ලද සේවාව සඳහා ගිවිසුම ප්‍රකාරව ගෙවීම් සිදු කරන ලද අතර ගෙවීම් සාධාරණ වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති වුවද, යෝජිත සමාගම ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ අරමුණු සමග අනුකූලවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය |

| | | |
|---|---|---|
| අවසන් කර තිබුණි. තවද, තාක්ෂණික සේවා සපයන්නන්ගේ ෙසහය ඇතිව සකස් කරන ලද ව්‍යාපාර යෝජනා 58ක් අතරින් 2022 මාර්තු 03 විගණිත දින වන විට යෝජිත සමාගම් 09ක් පමණක් සිය පළමු වාරිකය ලබාගෙන තිබුණි. | ක්‍රියාත්මක කිරීමට සූදානමින් ගැලපුම් ප්‍රදාන ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ප්‍රදාන ලබා දෙනු ලබයි. | පියවර ගත යුතුය. |

**3.3 ඌනඋපයෝජිත සම්පත්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 05ක් ගතවීමෙන් පසු ණය නියෝජිතායතනය විසින් කරන ලද රු. මිලියන 8,869.38ට සමාන එ.ජ.ඩො. මිලියන 61.19ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52ක් නියේජනය කරන රු. මිලියන 5,482.7කට සමාන එ.ජ.ඩො මිලියන 28.8ක් පමණක් 2021 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | 2021.12.31 දක්වා මුළු වියදම රු.මිලියන 5,482.7ක් විය. ආසන්න වශයෙන් එ.ජ.ඩො මිලියන 28.8ක් වේ. කෘෂිකාර්මික අංශ නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ සංරචක 1හි මුළු ප්‍රතිපාදනය එ.ජ.ඩො මිලියන 61.19 විය. මුළු ලබා ගැනීම් සියයට 52ක් වූ එ.ජ.ඩො මිලියන 31.8ක් වේ. | අරමුදල් උපයෝජනයේ කාර්ාක්ෂමතාව වැඩි කිරීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය විසින් 2017 වර්ෂයේදී රු.මිලියන 4.25ක පිරිවැයකට මිළදී ගන්නා ලද වෙබ් අඩවි පදනම් කරගත් GIS මෘදුකාංගය පසුගිය වර්ෂ 5 පුරා අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කර නොතිබුණි. | දැනුම සහ අත්දැකීම් සහිත උපදේශකවරයෙකු බඳවා ගැනීමෙන් පසු පැකේජය සම්පූර්ණයෙන්ම භාවිත කරන අතර ව්‍යාපෘතියට අපේක්ෂිත වාර්තා සහ විශ්ලේෂණාත්මක තොරතුරු ලබා ගැනීමට හැකියාව පවතී. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුගත වීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | වාහන සම්බන්ධ දුර්වල කළමනාකරණය හේතුවෙන් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව මෙවන විටත් මිළදීගෙන ඇති වාහන 10 පැවරීමකින් තොරව ව්‍යාපෘතිය වෙනත් වාහන 02ක් කුලියට ගෙන තිබුණි. එමනිසා, ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළදී වාහන කුලී ලෙස එකතුව රු.මිලියන 3.06ක් නිෂ්කාර්යව වියදම් කර තිබුණි. රියදුරන්ගේ පුරප්පාඩු 02ක් තිබුණද රියදුරන් රහිතව වාහන 02ක් කුලියට ගැනීම විගණනයේදී ගැටලු සහගත විය. | මෝටර් කාර් මඟින් ළඟාවීමට නොහැකි ස්ථානවල ක්ෂේත්‍ර පරීක්ෂනවලට යාමේ අරමුණින් මෙම වාහන දෙක කුලියට ලබාගෙන ඇත. සාමාන්‍යයෙන් මෝටර් කාර් කොළඹ ධාවනය සඳහා භාවිත කරනු ලැබේ. | -එම- |

**3.4 පරිබාහිර කටයුතු**

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ අරමුණුවලට අදාළ නොවන පුවත්පත් දැන්වීම් සදහා එකතුව රු.මිලියන 2.09ක් වියදම් කර තිබුණි. | කෘෂිකාර්මික අංශය නවීකරණය සදහා වූ ව්‍යාපෘතියේ විෂය පථයට අයත් අගය එකතු කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි අනාගත ව්‍යවසායකයන් ලෙස තෝරාගත හැකි රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් අයදුම්පත්‍ර කැදවීම සදහා ප්‍රචාරණය වෙනුවෙන් රු.මිලියන 1.2 දරා ඇත. 2020 කරන ලද අයවැය තීරණයක් අනුව සූර්යය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප පිළිබද ප්‍රචාරණය සදහා රු. 403,000 දරා ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සමඟ අනුගත වීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය |